මහර ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 13 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 13 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වත්කම් ඒකක 43 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | මෙම නිකුත් ආයතනවලින් වටිනාකම ලබාගෙන හෝ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට ලබාදෙන බව කාරුණිකව දන්වමි. |
| (ii) | ඩබල් කැබ් රථයක් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා රු.3,178,227 ක් සහ ආයුර්වේද තොගයේ වටිනාකම රු.319,568 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු.181,971 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිවිසුම්ගත වූ ව්‍යාපෘති පමණක් ණයහිමි ලෙස වෙන්කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ගිණුම් විෂයයන් 05 ක නොසැසඳුන ශේෂ එකතුව රු.102,894,975 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නැත. |

1.4 **අනුකූල නොවීම**
**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත්කර මාස 06 ඉක්ම වූ රු.379,219 ක චෙක්පත් 76 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රජයේ ආදායමට ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ඉක්ම වූ රු.5,610,456 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්ෂ 02 ඉක්මවා ඇති ආදායම් ශේෂ මෙම වර්ෂයේ සිට ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව වර්ෂ 1 ත් 3 ත් අතර ණයගැති ශේෂය රු.1,981,989 ක් සහ වර්ෂ 3 ත් 5 ත් අතර ණයගැති ශේෂය රු.2,326,591 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | තවදුරටත් ලැබිය සහ නොලැබිය හැකි ශේෂ පිලිබදව හදුනාගනිමින් හා සභාවට ඉදිරිපත් කරමින් ගිණුම් ගැලපීම් සිදුකරමින් පවතී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව වර්ෂ 1 ත් 3 ත් අතර ණයහිමි ශේෂය රු.34,387,568 ක්ද, වර්ෂ 3 ත් 5 ත් අතර ණයහිමි ශේෂය රු.10,818,287 ක්ද සහ වර්ෂ 5 ට වැඩි පොදු තැන්පත් ශේෂය රු.2,093,800 ක්ද පැවතුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | තවදුරටත් ගෙවීමට ඇති සහ ගෙවීමට නොමැති ශේෂ පිලිබදව හදුනා ගනිමින් මහා සභාවට ඉදිරිපත් කර ගිණුම් ගැලපීම් සිදු කරමින් පවතියි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.79,033,746 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,269,238 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| --------- | ----------- | ------------- | --------------- | ------------ | --------------- | --------------- | --------------- | ------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 11,086,300 | 11,640,113 | 11,353,520 | 4,248,493 | 10,163,000 | 12,980,012 | 9,451,933 | 3,961,900 |
| කුලී | 6,920,000 | 6,901,084 | 6,953,014 | -1,986,894 | 6,573,000 | 6,580,613 | 6,580,613 | (1,934,964) |
| බලපත්‍ර ගාස්තු | 2,580,400 | 2,262,157 | 2,263,157 | -237,664 | 2,461,100 | 1,733,552 | 1,733,552 | (236,664) |
| වෙනත් ආදායම් | 150,457,000 | 262,642,532 | 262,698,167 | 505,350 | 260,677,000 | 220,430,096 | 220,430,096 | 560,985 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 අප්‍රේල් 30 දිනට රු.මිලියන 3.7 ක හිඟ වරිපනම් ශේෂයක් තිබූ අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් හා ආදායම් අය කර ගැනීම සඳහා වාර්ෂික සැලැස්ම සකස් කර සෑම උප කාර්යාලයක් සඳහා ම ලබාදී ඇත. ඒ අනුව 2019 අප්‍රේල් 30 දින වනවිට හිග වරිපනම් බදුවලින් රු.767,393 ක් අය කර ගැනීමට කටයුතු කර ඇත. |

### .2.3 කුලී ආදායම් හා බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කුලී ආදායම් හා බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු.1,986,894 ක් හා රු. 237,664 ක සෘණ ශේෂ පෙන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතු වේ. | නව තක්සේරුව අනුව වරිපනම් බදු අය කරගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.4 **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ----------------------------- |
| (අ) | සභා බල ප්‍රදේශය තුල ඇති දුරකථන කුළුණු වලින් ආදායම් අයකර ගැනීම සඳහා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය පදනම් කර ගනිමින් අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ වැළඳගැනීම සිදු කළයුතු වේ. | අතුරු ව්‍යවස්ථාව පනවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන 182 ක් හඳුනාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිසර බලපත්‍ර නිකුත්කර තිබුණේ ව්‍යාපාර ස්ථාන 53 කට පමණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළුම ආයතන සඳහා ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව පරිසර බලපත්‍ර ලබාදියයුතු වේ. | පරිසර බලපත්‍ර ලබාගැනීම සඳහා දැනුම් දී ඇති අතර ඉන් සමහර ව්‍යාපාර ක්‍රියාත්මක නැත. |

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ---------------- | -------------------------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,332,740 ක් විය. | අයවිය යුතු උසාවි දඩ අයකර ගත යුතු වේ. | උසාවි දඩ හා ලේඛන මේ වන විට සකස් කර සහතික කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරුන් වෙත ඉදිරිපත් කර ඇති අතර එම මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | ------------------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා 12 ක් පනවාගෙන නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | ඉතිරි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 04 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉටුකළයුතු කාර්යයන් සියල්ලම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළයුතු වේ. | මීලඟ වර්ෂය සඳහා සකසන ක්‍රියාකාරී සැලැස්මට පනවා ඇති සියළුම අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතු කර්තව්‍යයන් සියල්ල ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවට මහජන පැමිණිලි 789 ක් ලැබී තිබූ අතර මහජන පැමිණිලි වලට විසඳුම් ලබා දීමේ ප්‍රගතිය සියයට 22 ක මට්ටමක වූ අතර මහජන පැමිණිලි සඳහා ප්‍රධාන කාර්යාලයේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මහජන පැමිණිලි නොපමාව විසඳීමට කටයුතු කළ යුතු වේ. | පැමිණිලි බහුතරයක් පරීක්ෂාකර ඇතත් එම කාර්යයන් ඉටුවූවාද නැද්ද යන්න සම්බන්ධව පසු විපරම් කිරීම සම්බන්ධව ප්‍රායෝගිකව ගැටළු මතුව ඇත. |

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය වෙනුවෙන් සකස්කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | දැනුවත් කර ඇති පරිදි 2019 වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්ම සකස් කරන ලෙස ලබාදුන් උපදෙස් පරිදි 2019-2023 තිරසර සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව මාර්ග 495 ක් සභාව සතුව පැවතියද ඉන් ගැසට්කර ඇත්තේ මාර්ග 24 ක් පමණක් වූ අතර පිඹුරුපත් සකස්කර ඇත්තේ මාර්ග 10 ක් තරම් අඩු | සියළුම මාර්ග සඳහා පිඹුරුපත් සකස්කර ගැසට් කළයුතු වේ. | අධික වියදමක් දැරිය යුතු නිසා පිඹුරුපත් සකස් කර ගැසට් කිරීමට යොමු කිරීම සිදු කර ඇත්තේ මාර්ග 10 කි. |

ප්‍රමාණයක් වෙනුවෙනි.

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම මාර්ග 495 හි වීථි ලාම්පු 17,621 ක් සවිකිරීම් සඳහා රුපියල් මිලියන 31.1 ක් වැය කර තිබුණි. මාර්ගවල වීථි ලාම්පු සවි කිරීමේ අවශ්‍යතාව,හා විදුලි කණු ප්‍රමාණය පිළිබඳ තොරතුරු පරීක්ෂාවක් සිදු කිරීමකින් තොරව වියදම් දරා තිබුණි. | පරීක්ෂාවක් සිදුකිරීමෙන් පසු වීථි ලාම්පු සඳහා වියදම් දැරිය යුතු වේ. | G.P.S තාක්ෂණය මගින් ජුනි මස සිට කණු අංක කිරීම ආරම්භ කරන අතර ඉන් අනතුරුව වීථි ලාම්පු නිකුත් කිරීම හා සවි කිරීම විධිමත් කිරීමට කටයුතු යොදා ඇත. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | --------------------------------- |
| (අ) | 2017 වසරේ සිට පවතින පුස්තකාලයාධිපති තනතුරු 02 ක් හා පෙර පාසල් තනතුරක් 2016 වර්ෂයේ සිටද, ආදායම් පරීක්ෂක තනතුරක් 2013 වර්ෂයේ සිටද පුරප්පාඩුව තිබූ අතර සංවර්ධන නිලධාරි තනතුරු 02 ක් අතිරික්තව තිබුණි. | පුරප්පාඩු නොපමාව පිරවිය යුතු අතර අතිරික්ත තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කරගත යුතු වේ. | පෙර පාසැල් ගුරු තනතුර සඳහා බඳවා ගැනීමට ගැසට් නිවේදන නිකුත් කර අයදුම්පත් කැඳවා ඇත.ආදායම් පරීක්ෂක තනතුර සඳහා නඩු තීන්දුව ලැබෙන තෙක් බඳවාගැනීම් සිදු නොකරන ලෙස දැනුම් දී ඇත. |
| (ආ) | 2004 ජූලි 09 දිනැති අංක එල්ජී/05/2004 දරන බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ පළාත් පාලන ආයතන වල නිලධාරීන්ගේ ඇප මුදල් ලබාගැනීමේ චක්‍රලේඛය අනුව නිලධාරීන් හය දෙනෙක් ඇප මුදල් තැන්පත්කර නොතිබුණි. | සේවක ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඇප මුදල් තැන්පත් ලබාදී නැති නිලධාරින්ගෙන් ලබාගැනිමට කටයුතු කරනු ලැබේ. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ---------------- |
| (අ) | සභාවට අයත් උප කාර්යාල තුනෙහිම වරිපනම් දේපල 1998 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. ඒ අනුව වරිපනම් ඒකක 12,997 කින් අයකලහැකි යාවත්කාලීන බදු ප්‍රමාණය අයකරගත නොහැකිවී තිබුණි. | නව තක්සේරුවකට අනුව වරිපනම් අයකළයුතු වේ. | මහර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ආවරණය වන පරිදි නව වරිපනම් තක්සේරුවක් කර ඇත. ඒ අනුව බදු අය කර ගැනිමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) | නාරංවල උප කාර්යාලයේ ඉඩම් විකුණුම් මත බදු අය කිරීමේදී විකුණුම් මත අය විය යුතු | විකුණුම් මිලෙහි වැඩිවීම අනුව හිඟ බදු අයකළයුතු වේ. | අදාල ආයතනය විසින් විකුණුම් මිල තීරණය කල පසු යම් වැඩි වීමක් ඇත්නම් පසුව හිඟ බදු ප්‍රමාණය අය |

| | | | |
|---|---|---|---|
| | සියයට 1 ක බදු ආදායම් නිලධාරියෙකුගේ තක්සේරුව මත අයකර ඇති අතර සත්‍ය විකුණුම් මිල පදනම් කරගෙන නොතිබුණි. | | කරනු ලබයි . |
| (ඇ) | කාර්යාල කටයුතු කළමනාකරණය කිරීම සඳහා 2013 ජනවාරි 01 දින නෙක්ෆා ඕස්ට්‍රේලියා පෞද්ගලික ආයතනය සමග ගිවිසුම්ගතව වරිපනම් බදු, විවිධ ආදායම්, ගිණුම් කටයුතු, තොග පාලනය, වීදි පහන් හා වැටුප් හා ක්ෂේත්‍ර කළමනාකරණ මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීම සඳහා රු.මිලියන 1.796 ක් වැයකර තිබුණ අතර එමගින් ක්ෂේත්‍ර හයෙහිම දත්ත රැස්කිරීම හා කළමනාකරණ කටයුතු සිදුකිරීම මූලික අරමුණ වුවත් ක්‍රියාත්මක වන්නේ වරිපනම් ආදායම් කළමනාකරණය පමණි. | ක්ෂේත්‍ර හය සඳහාම මෙම මෘදුකාංගය උපයෝගී කරගත යුතු වේ. | වරිපනම් ආදායම් කළමනාකරණයට අමතරව සියළු ආදායම් සඳහා ලදුපත් නිකුත් කිරීම , ප්‍රා.ස 3 වාර්තා ලබා ගැනීම ආදී කාර්යයන්ද ඉටු කරනු ලබයි. |

3.5 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.5.1 **<u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | --------------- | -------------------------------- |
| බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් 2013 වර්ෂයේදී පරිත්‍යාග කරන ලද රු.870,000 කට ගිණුම්ගත කර ඇති ට්‍රැක්ටරයක් හා ටේලරයක් පවරාගෙන නොතිබුණි. | මෙම වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | වාහන පවරා ගැනිම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත පෝරම භාර දී ඇත. |

3.5.2 **<u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | --------------- | ------------------------------------ |
| (අ) | පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාවේ ඉල්ලීමකින් තොරව 2014 නොවැම්බර් 17 දින සභාවට ලබාදි තිබූ ගැල්වනයිස් බට 640 ක් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම බට ප්‍රයෝජනයට ගත යුතු වේ. | මහජනතාවගේ ඉල්ලීම පරිදි පතාක කොඩි කණු ප්‍රජා සේවාවක් ලෙස සවි කර නැවත ගලවා ගැනීම සිදු කරයි. |
| (ආ) | කසළ අංගනයේ ටේලර් 03 ක් දීර්ඝ කාලීනව ඌන උපයෝජිතව පැවතුණි. | මෙම වත්කම් ප්‍රයෝජනයට ගතයුතු වේ. | එක් ටේලරයක් භාවිතයට ගෙන ඇති අතර ඉතිරි ටේලර් දෙක අළුත් වැඩියාවට යොමුකර ඇත. |

3.5.3 **වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භෞතික පරීක්ෂණයේදී හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හෙළිදරව් නොවූ වටිනාකම පිළිවෙලින් රු.112,400, රු.4,148 ක් හා 35,200 ක් වූ කසළ කරත්ත 10 ක්, වීල් බැරෝ 04 ක්, බයිසිකල් 06 ක්, ලෙස මෝටර් රථ හා කරත්ත ගිණුමේ ඇතුළත්ව තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | විධිමත් ක්‍රියාවලියකින් හඳුනා ගැනිමෙන් පසු ඉදිරියේ දී අවසන් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව රු.141,714 ක් වටිනා පොත් 876 ක් අස්ථානගතවී තිබුණු අතර රු.361,131 ක් වටිනාකමැති පොත් 1313 ක් සාමාජිකයන් විසින් රැගෙන ගොස් නැවත භාරදී නොතිබුණි. | මෙම පොත් සියල්ලම සොයා ගැනීම හෝ පාඩු අයකර ගැනීමට හෝ කටයුතු කළයුතු වේ. | වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන අතර භාර නොදුන් පොත්වලින් කොටසක් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. |

3.6 **ප්‍රසම්පාදනය**

3.6.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (b) හා (c) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු වේ. | ඉදිරි වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (b) හා (c) පරිදි සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.6.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාර්ග ව්‍යාපෘති 124 ක් සඳහා ඇල්ලූ කොන්ක්‍රීට් කුට්ටිගල්වල සම්පීඩන ශක්තිය පිළිබඳව රසායනාගාර පරීක්ෂාවකින් තහවුරු කර ගැනීමකින් තොරව රු.34,947,169 ක් ගෙවීම් සිදුකර තිබුණි. | පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන ගෙවීම් සිදු කළයුතු වේ. | සියලු ව්‍යාපෘති සඳහා සම්පීඩන පරීක්ෂණ සිදු නොකරන අතර කොන්ක්‍රීට් මිශ්‍රණවල ප්‍රමිතිය පිළිබඳව තාක්ෂණ නිලධාරින් සෑහීමකට පත් නොවන අවස්ථාවලදී සම්පීඩන පරීක්ෂණ සිදු කරයි. |

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ----------------- | ----------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් කර්තව්‍යයන් 13 ක් සඳහා වෙන්කරගත් රු.13,849,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | අයවැයගත ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කළ යුතු වේ. | විවිධ හේතූන් නිසා වෙන්කළ මුදල් වියදම් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. |
| (ආ) | වැය විෂයයන් 37 කට අදාලව රු.24,891,200 ක් ඉතිරිව තිබූ අතර මෙම ඉතිරිය සියයට 17 සිට සියයට 96 දක්වා පරාසයක තිබුණි. | අයවැයගත ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කළයුතු වේ. | විවිධ හේතූන් නිසා වෙන්කළ මුදල් වියදම් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. |

4.2 **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | -------------------- |
| 2018 වර්ෂයේ ප්‍රථම කාර්තු 02 හි කළමනාකරණ කමිටු පවත්වා නොතිබූ අතර වර්ෂයටම කමිටු දෙකක් පමණක් පවත්වා තිබුණි. | නියමිත පරිදි කමිටු පැවැත්විය යුතු වේ. | 2019 වර්ෂයේ නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |